අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.LK

සිංහල භාෂාව හා සාහිත්‍යය 1 පත්‍රය 10 ශ්‍රේණිය කාලය පැය 1 යි

සියළුම ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න

- දී ඇති අදහසට වඩාත් ගැලපෙන අදහස තෝරන්න

1. තදබල ලෙස දොස් කීම
   1 ) දෙහි කපනවා 2 ) නාකපන 3 ) මඩ ගසන 4 ) කඩා කන
2. ඉබාගාතේ යනවා
   1 ) ඉක්මනින් යනවා 2 ) නිදැල්ලේ යනවා 3 ) හෙමින් යනවා 4 ) ආපසු යනවා
3. හුඹස් බිය
   1 ) සහේතුක බියක් 2 ) සර්ප බියක් 3 ) අහේතුක බියක් 4 ) ලොකු බියක්
4. තටාකය
   1 ) ළිඳ 2 ) දොළ 3 ) මුහුද 4 ) විල

- වරහන තුල ඇති වචන වලින් තුනක් සමානාර්ථය නොගැලපෙන වචනය තෝරන්න

5. 1 ) ගින්න 2 ) අග්නි 3 ) අකල 4 ) උදක
6. 1 ) පොළොව 2 ) මිහි 3 ) අරණ 4 ) දෙරණ
7. 1 ) ශ්‍රේෂ්ඨ 2 ) තීක්ෂණ 3 ) උසස් 4 ) සෙට
8. 1 ) අඹුව 2 ) කාන්තාව 3 ) මාගම 4 ) ගැහැනිය

- දී ඇති වචන සමූහය වෙනුවට සුදුසු තනි වචනය තෝරන්න

9. නොයෙක් දේශවල ඇවිදින්නා
   1 ) දේශාටක 2 ) සංචාරක 3 ) ගවේශක 4 ) විදේශික
10. බොහෝ ඇසූ පිරූ තැන් ඇති තැනැත්තා
   1 ) උගතා 2 ) බහුශ්‍රැතයා 3 ) වියතා 4 ) ජගතා
11. රාත්‍රියෙහි හැසිරෙන්නා
   1 ) රස්තියාදුකාරයා 2 ) හොරා 3 ) නිශාචරයා 4 ) වනචරයා
12. සිත් ඇද ගන්නා සුළු
   1 ) දර්ශනීය 2 ) රමණීය 3 ) දැකුම්කළු 4 ) සිත්කළු

හිස් තැනට සුදුසු වාක්‍ය තෝරන්න

13. සිසු කැල විනීතව පාරේ ගමන් ……………………………………………………..
   1 ) කරයි 2 ) කරති 3 ) කරන්නේය 4 ) කළේය
14. හිරු කිරණින් පියුම්හු විකසිත ……………………………………………………..
   1 ) වෙයි 2 ) වෙති 3 ) විය 4 ) වන්නේය
15. ඇතැමෙක් නිකරුනේ කාලය ගත ……………………………………………………..
   1 ) කරති 2 ) කරයි 3 ) කරන්නේය 4 ) කළාය
16. ක්‍රීඩා කණ්ඩායමෙන් එක් අයෙක් ඉල්ලා ……………………………………………………..
   1 ) අස්වෙයි 2 ) අස්වෙති 3 ) අස්වූවෝය 4 ) අස්වූවාය
17. මව හෝ පියා රැස්වීමට සහභාගි ……………………………………………………..
   1 ) වෙයි 2 ) වෙති 3 ) වූවාය 4 ) වූවෝය
18. සභා තොමෝ සතුටින් විසිර ……………………………………………………..
   1 ) ගියාය 2 ) ගියේය 3 ) ගියහ 4 ) වූවෝය



ඉස්කෝලේ edulanka.lk

19. අපි ශ්‍රී ලාංකිකයෝ ……………………………………………………….
   1 ) වෙමු   2 ) වෙයි   3 ) වෙති   4 ) වූහ
20. පියා නොහොත් මව රැස්වීමට සහභාගි ……………………………………………………….
   1 ) වෙමි   2 ) වෙයි   3 ) වෙති   4 ) වූහ

- පහත සඳහන් වචන වලින් අක්ෂර වැරදි ලෙසයෙදී ඇති පදය තෝරන්න

21. 1 ) පරිණත   2 ) දර්ශණ   3 ) ප්‍රශ්න   4 ) මිශ්‍රණ
22. 1 ) පළල   2 ) යළ   3 ) ළග   4 ) පොළ
23. 1 ) ප්‍රතිඵල   2 ) ප්‍රස්තාර   3 ) මර්දනය   4 ) පුස්තකාලය
24. 1 ) ප්‍රශස්ති   2 ) අභිලාශය   3 ) කොට්ඨාසය   4 ) ආභාසය
25. 1 ) දුරස්ථ   2 ) සංවර්දනය   3 ) ඡන්දය   4 ) ශ්‍රේෂ්ඨ

- පහත දී ඇති පද වලින් තුනක් එකම ව්‍යාකරණ වර්ග වලට අයත්ය එසේ නොවන පදය තෝරන්න

26. 1 ) ඔහු   2 ) මම   3 ) එය   4 ) ඌ
27. 1 ) වෙන්   2 ) නොහොත්   3 ) රතු   4 ) පිණිස
28. 1 ) යනෙන   2 ) පිනැති   3 ) ලියවිලි   4 ) තටුවල
29. 1 ) ඉසුරුවන්   2 ) වරලස   3 ) සෙල්මුවා   4 ) දඩයම
30. 1 ) කළොත්   2 ) අඬ අඬා   3 ) වැඩ   4 ) යද්දී

- පහත සඳහන් වාක්‍ය අතුරින් ව්‍යාකරණ අනුකූලව වඩාත් නිවැරදි වාක්‍යය තෝරන්න

31. 1 ) ප්‍රදර්ශනයේ විවිධ අංශ නැරඹීමද අපේ වැඩ සටහනට ඇතුලත් වුනෙමු
   2 ) පයින් යන්නන් පදික වේදිකාවෙන් යා යුතුය
   3 ) ළමයින් නවකතා පොත් කියවීමට කැමතිය
   4 ) විදුහල්පති තුමා ළමයි අමතා කථා කරති
32. 1 ) ගැහැණු ළමයි මෙන්ම පිරිමි ළමයිද විභාගයට පෙනී සිටිති
   2 ) සියළුම ක්‍රීඩකයන් නියමිත වේලාවට පැමිණියහ
   3 ) ගොවියන් විසින් කුරුල්ලෝ එළවන ලදහ
   4 ) එදා රැස්වීමට වැඩි දෙනෙක් පැමිණ නැත
33. 1 ) නිළියක් ලෙස ප්‍රසිද්ධියට පත් ඕතොමෝ ගීත ගායනයද කරති
   2 ) ශ්‍රී ලංකාවේ අනාගත පුරවැසියන් අපියි
   3 ) මන්ත්‍රීවරුන් සමග පැමිණි ඇමතිතුමා විද්‍යාගාරය විවෘත කළේය
   4 ) ගුරුතුමී ශිෂ්‍යාවෝ සහ ශිෂ්‍යයෝ කැටුව පාසලට එති
34. 1 ) ක්‍රීඩා තරගය පිළිබඳ ශිෂ්‍යාවන් තුලද උනන්දුවක් තිබුණාය
   2 ) මම අපේක්ෂකයෙක් විනා පරීක්ෂකයෙක් නොවෙමි
   3 ) විදේශිකයෝ ශ්‍රී ලංකාවට පැමිණීමට කැමතිය
   4 ) රැස්වීම අවසානයේ සියල්ලන්ම නිවෙස් බලා ගියහ
35. 1 ) අපි වැඩි දෙනෙකු සංගීතය හැදෑරීමට කැමතිය
   2 ) අනුශාසනාව පවත්වන ලද්දේ නාහිමියන් විසින්ය
   3 ) අම්මාද නංගීද අපි එනතුරු බලා සිටියාය
   4 ) රචනා රීතීහු විවිධත්වයක් දරයි

- පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න

අපි බ්‍රිතාන්‍ය අධිරජ්‍යයට යටත් වී වසර 150 කට ආසන්න කාලයක් විවිධ මට්ටමේ වෙනස්වීම් වලට මුහුණ දුනිමු නිදහස ලබා වසර 50ක් ගත කළෙමු විවිධ දේශපාලන පෙරලි වලට මුහුණ දුන්නෙමු වරින් වර පත්වූ විවිධ රජයන්

යටතේ පාලනය වී ඇත්තෙමු විසි එක්වන සියවසට පිය නගන අපි ආර්ථික සාමාජික සංස්කෘතික සංවිධානයක් ලබා ඇත්ද යන්න ගැන විමසිලිමත් වියයුතු වෙමු නූගත්කම සහමුලින් තුරන්කිරීමට නොයෙක් උත්සාහ දැරූවද ඒ ඉටු වී නැත ගම්බද හා නාගරික පාසල් අතර පවත්නා තදබල විෂමතාව හේතුවෙන් අනිවාර්ය අධ්‍යාපනය ලබා ගැනීමට ඇති ඉඩකඩ ඇහිරී ගොසිනි විධිමත් හා වැඩිපුර අධ්‍යාපනය ලබා ගැනීමට ඇති අවස්ථා අල්පය මේ නිසා පෞද්ගලික ආධාරක පංති ක්‍රමයක් දිවයින පුරා ක්‍රියාත්මකය අද ගුරුවරයෙකු සිටින සෑම ගෙදරකම පාහේ උපකාරක පංතියක් තිබීම දැකිය හැකිය පළමු ශ්‍රේණියේ සිටම උපකාරක පංතියකට ළමයෙකු යැවීම අද කිසියම් රටාවක් බවට පත්ව ඇත ප්‍රධාන පෙළේ පාසලකට ළමයෙකු ඇතුලත් කර ගැනීමට විවිධ උපක්‍රම යොදති

36. මෙහි සඳහන් වන පරිදි පෞද්ගලික ආධාරක පංති ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේ කුමක් නිසාද ?

1) ගුරුවරයෙකු සිටින සෑම ගෙදරකම පංති පැවැත්වෙන නිසා
2) විධිමත් හා වැඩිපුර අධ්‍යාපනය ලැබීමට ඇති ඉඩකඩ අල්ප නිසා
3) පෞද්ගලික ආධාරක පංති ක්‍රමය සාර්ථක නිසා
4) ආධාරක පංති කෙරෙහි ගුරු අවධානයයොමුවන නිසා

37. දෙමව්පියන් විවිධ උපක්‍රම යෙදීමට පෙළඹී ඇත්තේ කුමක් සඳහාද ?

1) ප්‍රධාන පෙළේ පාසලකට දරුවා ඇතුලත් කිරීමට
2) තම දරුවා උපකාරක පංතියකට යැවීමට
3) තරගකාරී ස්වරූපයෙන් දරුවාට ඉගැන්වීමට
4) තම දරුවාට උසස් අධ්‍යාපනයක් ලබාදීමට

38 තවමත් සහමුලින් තුරන් කිරීමට නොහැකි වී ඇත්තේ

1) නූගත්කම 2 ) පෞද්ගලික පංති ක්‍රමය 3 ) දේශපාලන වෙනස්වීම් 4) පරාධීන හැඟීම්

39 දෙමව්පියන් අතර මෝස්තරයක් බවට පත්ව ඇත්තේ කුමක්ද ?

1) දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දීමට දෙමව්පියන් දක්වන උනන්දුව
2) පළමු ශ්‍රේණියේ සිට ළමයා උපකාර පංතියට යැවීම
3) පාසල කෙරෙහි දෙමව්පියන් තුල පවත්නා දැඩි කැපවීම
4) දරුවාගේ අධ්‍යාපන කටයුතු වලට සහයෝගයක් දැක්වීම

40 ගම්බද නාගරික පාසල් අතර ඇති විෂමතාවය නිසා බාධා වී ඇත්තේ කුමකටද ?

1) යටත් විජිත වාදයෙන් මිදීමට
2) දේශපාලන පෙරලි වලින් ඈත් වීමට
3) අනිවාර්ය අධ්‍යාපනය ලබා ගැනීමට
4) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීමට



edulanka.lk

අවසාන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය 11 කාලය පැය 2 යි

1 ) පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට අදාල පිළිතුර ලියන්න

1) " ඓ " " ඖ " යන අක්ෂර වලින් වචනය බැගින් ලියන්න
2) සකුතුක අක්ෂර කීයද ? ඉන් තුනක් ලියන්න
3) " ඉලි " ප්‍රත්‍ය යොදා කෘදන්තපදයක් ලියන්න "ඔන්" ප්‍රත්‍ය යොදා තද්ධිත පදයක් ලියන්න
4) පහත දැක්වෙන කවි පදවල උපමා උපමේය වෙන්කර ලියන්න
   රජරටේ වැවක් මෙන් මට්ටමට වෙල පිරී - හිම වතුර කැට බිඳී දැලක් මෙන් නැගෙනවා
5) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න
   අ) ගොවියෝ කුඹුරු කොටති ආ) විදුහල්පතිතුමා රැස්වීම අමතයි
6) පහත දැක්වෙන පදවල විරුද්ධ පද ලියන්න
   අ) සංකීර්ණ ආ) ස්වභාවික
7) පහත සඳහන් ක්‍රියා පද වර්ග නම් කරන්න
   අ) නට නටා ආ) කරතොත්
8) 8 ) පහත සඳහන් වාක්‍ය නිවැරදි කරන්න
   අ) රියදුරන් හොඳින් වාහන පදියි යි පොළීසිය සිතයි
   ආ) ගම්බද සිසුන් අධ්‍යාපනයට ලැදි වෙති
9) අ) යන + එන ආ) මිහිඳු + තලය යන පද විසන්ධි කරන්න
10) සම්ප්‍රදාන විභක්තිය හා කරණ විභක්තිය යන දෙක සඳහා උදාහරණ දෙකක් ලියන්න

2 ) පහත දැක්වෙන විස්තර වලින් එකක් තෝරාගෙන වචන 250 ක පමණ රචනයක් ලියන්න සුදුසු මාතෘකාවක් යොදන්න

අ) අතීතයෙන් උරුම වු උදාර සාහිත්‍යක් සිංහලයන් වු අප සතුව ඇත ගද්‍ය ලෙසින් මෙන්ම පද්‍ය ලෙසින්ද අප හමුවට එන මෙම නිර්මාණයන්ගෙන් අපට විවිධ ප්‍රයෝජන ලැබේ එම කතුවරුන් සතු විස්මිත කලා කුසලතා අපි නිරතුරුව අගයමු ඉන් ගතහැකි ආදර්ශයන්ගෙන් පෝෂණය වී අනාගත පරපුරට කිසියම් පරිත්‍යාගයක් අපට කල හැකි වුවහොත් එය අපගේ ජාතියට ඉටුවන මහඟු යුතුකමක් වනු ඇත

ආ) පැරණි සිංහලයා බෙහෙවින් ආගම දහමට නැඹුරු ජීවිතයක් ගත කළහ ඔවුන් සතුව පැවති සත්චාරිත්‍රයක් කෙරේ ආගමික බලපෑම බෙහෙවින් පැවතුනි පන්සල පල්ලිය කෝවිලට බොහෝ දුරින් ජීවත්වන අද බොහෝ දෙනෙකුට යහ ගුණ දම් කෙරෙහි කිසිම හැඟීමක් ඇති බවක් නොපෙනේ චරිත සංවර්ධනය කෙරෙහි කවර හෝ ආගමකට කල හැකි දෙය බොහෝය

ඇ) නිරෝගි ජීවිතයකට පිරිසිදුකම අත්‍යවශ්‍ය අංගයකි බාහිර පිරිසිදුකම සමගම අභ්‍යන්තර පරිශුද්ධතාවයද ඒ කෙරෙහි සුලුපටු නොවන බලපෑමක් ඇති කරයි සියලු ක්‍රියාකාරකම් කෙරෙහි මූලිකව කටයුතු කරනුයේ සිතයි

ඉ) අද සමාජය දියුණුව යන්න තක්සේරු කිරීම සඳහා යොදාගෙන ඇති මිනුම් දඬුව වන්නේ මුදල්ය මුදලින් කල නොහැකි බොහෝ දෑ ඇති බව ඔවුහු නොසලකති ජීවත්වීම සඳහා මුදල් අවශ්‍ය වේ එහෙත් දියුණුව යනු මුදල් පමණක්ම ලෙස නොසැලකිය යුතුය

3 ) පහත දැක්වෙන පාඨය වචන 20 - 25 අතර ගණනින් සාරාංශ කරන්න.

වාතය ජලය සහ ඇතැම් ගහකොළ ආදිය හැර මෙලොව කිසිවක් මහන්සියෙන් තොරව නිපදවාගත නොහැකිය. ඒවායින් නිසි ඵල ලබා ගැනීමට අප මහන්සි වී ක්‍රියා කළ යුතුය. අප ප්‍රයෝජනයට ගන්නා සෑම දෙයක්ම නිපදවා ඇත්තේ අඛණ්ඩ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙනි. විනෝදය සඳහා පමණක් මහන්සි වීම සමහරුන්ගේ සිරිතක් වුවද



ඉස්කෝලේ
edulanka.lk

නිෂ්පාදනයට පිටුපා අප ක්‍රියා කරන්නේ කලාතුරකිනි. ස්වභාවික දේ මිනිස් අවශ්‍යතා වලට සරිලන සේ සැකසීම හැඳින්වෙන්නේ නිපදවීම නමිනි. මේ නිපදවීම් වල ප්‍රතිඵලයක් ලෙස ධනය බිහිවේ.

4) පහත සඳහන් කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මම මහ රජෙක් වෙමි යුතුකම රජ දාන
නොම දෙමි ඉඩ දැනට එහි විලිබිය හීන
දමමින සිපත සුරතට අරගෙන පෑන
හැම සතුරන් මඩිමි මම එඩිකම් පාන

ලොල් ඉසි මද මාන ඈ කටු පඳුරු වැවී
වල් බිහිවී තිබෙන ලොව සැඩ සතුන් සෙවී
මුල් පිය මගේ පදනම කොට රැගෙන අවී
මම උයනක් කරමි බිගු නද පිරුණු කවී

දෙගුරුන් ගෙලෙන් එල්ලී සුරතල් පාන
දරුවන්ගෙන් පිරුණු කුසගිනි නොම පේන
මිහියෙන් කිරෙන් උතුරන රටකට නූන
ලෝවැසින් ගෙන යන්ට මම වෙමි සුර පාන

1) සිපත ඉසි සෙවි යන පදවල අරුත් දක්වන්න
2) කටු පඳුරු හා අපි සමාන කොට ඇත්තේ කවර දේ වලටද?
3) මිහියෙන් කිරෙන් උතුරන යන්නට සමාන සම්ප්‍රදායික යෙදුම කුමක්ද?
4) "වල් බිහිවී තිබෙන ලොව සැඩ සතුන් සෙවී" මෙහි දැක්වෙන සමාජ විවරණය කෙටියෙන් ලියන්න.
5) කවියාගේ මූලික අපේක්ෂා 3ක් ඔබේ බසින් ලියන්න.

5) ප්‍රදේශයේ පවතින ජලභීතිකා රෝගය නිසා ඉන් සිදුවිය හැකි අනතුරු බොහෝය. මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් පිළිබඳව මහජන සෞඛ්‍ය නිලධාරී තුමා සකස් කරන අත් පත්‍රිකාව නිර්මාණය කරන්න.

---

අවසාන වාර පරීක්ෂණය

සිංහල භාෂාව හා සාහිත්‍යය - 111 පත්‍රය    10 ශ්‍රේණිය    කාලය පැය 2 යි

---

1, 2, 3, 4 යන ප්‍රශ්න සියල්ලටද 5, 6, 7 යන ප්‍රශ්න වලින් එකක්ද තෝරාගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න.

1. කෙටි පිළිතුරු ලියන්න.

I. (අ) අපටත් දවසක ඉර පායාදෝ කෙටි කථාව උපුටාගත් පොත කුමක්ද?
   (ආ) එම කථාව ලියූ ලේඛකයා කවුද?

II. (අ) වැස්ස කවි පන්තිය ලියූ ලේඛකයා කවුද?
   (ආ) එම ලේඛකයා ලියූ වෙනත් නිර්මාණ 2ක් ලියන්න.

III. (අ) අපටත් දවසක ඉර පායාදෝ කෙටි කථාව ලියූ ලේඛකයාගේ තවත් පොතක නම ලියන්න.
   (ආ) ජීවක කථා වස්තුව ඇතුලත් මුල් පොතේ නම ලියන්න.

IV. (අ) ජීවක කථා වස්තුව ලියූ ලේඛකයා කවුද?
   (ආ) එම මුල් පොත ලියූ යුගය කුමක්ද?

V. (අ) මගුල් ප්‍රස්ථාව නාට්‍යය කුමන නාට්‍යය ගණයට අයත්ද?
   (ආ) එය කුමන ශෛලියට අයත්ද?

VI. (අ) මගුල් ප්‍රස්ථාව නාට්‍යය ලියූ මුල් ලේඛකයා කවුද?
   (ආ) එය සිංහලට පරිවර්තනය කළ කතුවරයා ලියන්න.

VII. (අ) මහමායා දේවිය දුටු සිහිනය පැදිපෙල කුමක් අරභයා ලියන ලද්දක්ද?
   (ආ) එම පොත ලියූ යුගය කුමක්ද?

VIII. (අ) කිඳුරු වළප කවි පන්තිය උපුටාගත් මුල් පොතෙහි නම ලියන්න.
   (ආ) එම පොත ලියූ ලේඛකයාගේ නම ලියන්න.

IX. (අ) කිඳුරු වළප කවි පන්තිය අයත් මුල් පොත ලියූ යුගය කුමක්ද?
   (ආ) මෙම යුගයේ ලියූ වෙනත් ග්‍රන්ථයක නම ලියන්න.

X. (අ) ජාතක කථා පොත ලියූ යුගය කුමක්ද?
   (ආ) ජාතක කථා පොතින් උපුටා ගත් ඔබගේ සාහිත්‍ය පාඨ ග්‍රන්ථයේ සඳහන් ජාතක කථාව කුමක්ද?

2. පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ වල ඉරි ඇඳි පද වල අදහස පළමුව ලිහිල් බසින් ලියා පසුව මුළු කොටසේම අදහස ලිහිල් බසින් ලියන්න.

(අ) පදමට <u>වෙරළු මිණිකැට</u> සුණු විසුල    හැඩ
<u>ජෝතිය</u> ලැගුම් ගත් ලා තණ පීටිය    උඩ
නැහැ පුඩු මහත් කොට මීගොන් මුළුව    නැඩ
කිම්දෙති නැවුම් පුස්ඹෙහි වෙල් කුඹුරු    බඩ

(ආ) සිටු දේවියගේ ආබාධය පිළියම් කොට <u>සම්පත් ලද නියාවන්</u> යනාදී සරුප කියා මේ මා ලද පළමුවන සැපත නුඹ වහන්සේ මා වැඩි ...............................මිලයට ගෙන වදාළ මැනවැයි කීහ

(ඇ) සුද්දේ උභය කුළ පුතු අප    පසිද්දේ
වද්දේ විනා නොකෙරෙති ලොව    නොවද්දේ
බැද්දේ ඇවිදිනා දඩයමෙහි    ලද්දේ
වැද්දේ කියත යුතු මහ රජෙකි    විද්දේ



edulanka.lk

(ඇ) ඒ දවස්වල අම්මාගේ කුඩෙ පස්සෙන් නම් කපුටන් ගත් අට දෙනෙකුට අඩු වෙන්නේ නැහැ. <u>රොත්ත පිටින්</u> එනවා <u>පොරකකා</u>

3. නූතන වෛද්‍යවරයෙකුට ගත හැකි ආදර්ශ රැසක් ජීවක වෛද්‍යවරයාගේ චරිතය තුළින් දැකගත හැකිය. මේ පිළිබඳ ජීවක කථා වස්තුව තුළින් පෙන්වා දෙන්න.

4. වැස්ස කවි පන්තිය තුළින් කවියා සජීවී හා අජීවී යන වස්තූන් සියල්ලම වැස්ස නිසා එකසේ ප්‍රමෝදයට පත් වූ අයුරු දක්වයි. මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

5, 6, 7 යන ප්‍රශ්න වලින් එකකට පිළිතුරු ලියන්න.

5. මගුල් ප්‍රස්ථාව නාට්‍යය තුළින් සමාජයේ පවත්නා පොදු දුර්වලතා හාස්‍යයට ලක්කරයි. මේ පිළිබඳ උදාහරණ දක්වමින් කරුණු දක්වන්න.

6. මහමායා දේවිය දුටු සිහිනය පැදිපෙල ඇසුරු කරගෙන යසෝධරාවත කවියා ජන කවි ආරයෙන් කවි ලිවීමට දක්ෂතාවයක් දක්වා ඇති බව පැහැදිළි කරන්න.

7. කිඳුරු වලප පැදි පෙළ ලියූ ලේඛකයා සුදුසු කාව්‍ය උපක්‍රම යොදා කවි ලිවීමට දක්ෂ කවියෙකි. මේ බව උදාහරණ සහිතව පෙන්වා දෙන්න.



ඉස්කෝලේ
edulanka.lk